ලංකා කොමියුනිස්ට් තරුණ සම්මේලනය
இலங்கை கம்யுனிஸ்ட் வாலிபர் சம்மேளனம்
Communist Youth Federation of Sri Lanka

# එච්. එන්. ඩී. ඒ සිසුන්ට සිදුකල ප්‍රහාරය හා මර්ධනය තරයේ හෙලා දකිමු.

## ලංකා කොමියුනිස්ට් තරුණ සම්මේලනය

පසුගිය ඔක්.29 වැනි දින උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (එච්. එන්. ඩී. ඒ ) හදාරන සිසු සිසුවියන් විසින් තම අයිතීන් කීපයක් මුල්කරගනිමින් සිදු කරනලද උද්ඝෝෂණයේදී එම සිසු සිසුවියන්ට පොලීසිය විසින් එල්ලකරන ලද ඉතා අමානුෂික හා නින්දිත ප්‍රහාරය ලංකා කොමියුනිස්ට් තරුණ සම්මේලනය දැඩි පිළිකුලෙන් යුතුව හෙලාදකී.

මෙම සිසු සිසුවියන් ඉල්ලා සිටියේ වර්ෂ 1990 දී තම ඩිප්ලෝමාව වානිජවේදී උපාධියට සමාන්තරව පැවැති බවත් වර්ෂ 2014 දී තමන්ට එම තත්ත්වය අහිමි කළ බවත් ඩිප්ලෝමා කාලය වසර 3 කට සීමා කර ඇති බවත් 4 වන වසර අධ්‍යයන කටයුතු සඳහා මුදල් ගෙවීමට සිදුවන බවත් ඒ හා සමාන තවත් ඉල්ලීම් කීපයක් ඉටුකරදෙන ලෙසත් ය.

මෙම සිසු සිසුවියන් වර්ෂ 2014 දී ගත් ක්‍රියාමාර්ගයට විරුද්ධව එම වසරේ දෙසැම්බර් 22 වන දින සිදුකල උද්ඝෝෂණයට විරුද්ධව එල්ලකළ මර්ධනය අද ආන්ඩු කරන එදා විපක්ෂයේ සිටි යහ පාලකයින් පවසා සිටියේ තම රජයක් යටතේ සිසුන්ගේ සාධාරන ඉල්ලීම් වලට සහන සලසන බවයි.

තවද මෙම දෙමුහුන් ආන්ඩුවේ පොලීසිය සහ විශ්වවිද්‍යාල භාරව කටයුතු කරන්නේ එ.ජා.පයේ අමාත්‍යවරුන් දෙපලක් වන අතර වසරක් ගතවීමටත් මත්තෙන් යහ පාලනයේ තරම සහ සැහැසියාව රටට දැනෙන්නේ මෙලෙසිනි.

එබැවින් ලංකා කොමියුනිස්ට් තරුණ සම්මේලනය තරුණ සහෝදර සහෝදරියන්ට ආයාචනය කරනුයේ තරුණ සහ ශිෂ්‍ය ගැටළු වෙනුවෙන් පෙනීසිටින ලෙසත් යහ පාලන රජයේ ජනතා විරෝධී ක්‍රියාමාර්ග හෙලාදකින ලෙසත් ය.

වීරසුමන වීරසිංහ
ප්‍රධාන ලේකම්, ලංකා කොමියුනිස්ට් තරුණ සම්මේලනය

සංජීව විජේකෝන්
ජාතික සංවිධායක, ලංකා කොමියුනිස්ට් තරුණ සම්මේලනය